# මානව වංශ විධි විවරණ හා
# එහි පර්යේෂණ ලක්‍ෂණ පිළිබඳ විමසුමක්

හඳගිරියේ සිරිසුමන හිමි

පර්යේෂණ ක්ෂේත්‍රය තුළ ගුණාත්මක පර්යේෂණ ක්‍රම (qualitative research), ප්‍රමාණාත්මක පර්යේෂණ ක්‍රම (quantitative research) හා මිශ්‍ර පර්යේෂණ ක්‍රම (mixed methods research)[1] වශයෙන් පර්යේෂණ පිරිසැලසුම් තෙවැදෑරුම් ය. මානව වංශ විධි විවරණ පර්යේෂණ ක්‍රමය වනාහි ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදයට අයත් සුවිශේෂ පර්යේෂණ ක්‍රමයකි. මානව වංශික, ස්වභාවවාදික, මානව විද්‍යාත්මක, ක්ෂේත්‍ර පර්යේෂණ හෝ සහභාගී නිරීක්‍ෂණ, විමර්ශනාත්මක ක්‍රම විද්‍යාව යොදාගනිමින් සිදුකරනු ලබන පර්යේෂණ ක්‍රම හැඳින්වීමට භාවිත සූචක (Generic) පදයක් ලෙස 'ගුණාත්මක පර්යේෂණ' යන පදය භාවිත වේ.[2] ගුණාත්මක පර්යේෂණ ක්‍රමය පිළිබඳ විවිධ විචාරක මත දැකිය හැකි ය. ඇතමෙක් මානව වංශ විධි විවරණ වෙනම පර්යේෂණ ක්‍රමයක් ලෙස ද හඳුන්වා ඇත. (Goetz & Lecompte, 1984)[3] මානව වංශ විධි විවරණ පර්යේෂණ (Ethnography) යන්නෙහි ව්‍යාචාර්ථය විමසීමේදී රොබට්සන්ට අනුව Ethno යන්නෙන් 'ජන සමූහය' හැඳින්වෙන බවත්, Ethnography යන ග්‍රීක් වචනයෙන් බිඳී ආවක් බවත් දක්වයි.[4] (Robertson, 1981:13) එසේම Ethno යන්නෙහි අදහස ජනතාව ලෙස ද graphy යන්නෙහි අදහස විස්තර කිරීම ලෙස ද හුසේන් හා හුසේන් විග්‍රහ කරයි. (Hussen & Hussen,1997:68)[5] මේ අනුව මානව වංශ විවරණ පර්යේෂණය යන්නට විවිධ නිර්වචන ඉදිරිපත් කර ඇති බව පෙනේ.



ටෆ්ට්ගේ අදහස අනුව මානව වංශ විවරණයෙන් සිදුවනුයේ පුද්ගලයන් පිළිබඳ අධ්‍යයනය කිරීමයි. ''සමාජ කණ්ඩායමක සංස්කෘතිය අනුව එම කණ්ඩායමේ සාමාජිකයන්ගේ පෞද්ගලික හා පොදු හැසිරීම පිළිබඳ සොයා බලා විස්තර කිරීම මානව වංශ විවරණයයි.''[6] (Taft, 1998:59) මානව වංශ පර්යේෂණය හා එහි ක්‍රියාකාරීත්වය පිළිබඳ පුළුල් විග්‍රහයක් සහිතව පැහැදිලි නිර්වචනයක් හැමස්ලේ හා ඇට්කින්සන් (Harmersley & Atkinson 1983) ඉදිරිපත් කරයි.

''මානව වංශ විවරණ පර්යේෂණ යනු පර්යේෂකයා විවෘතව හෝ සංවෘත පුද්ගලයන් සමඟ දිනපතා හෝ තෝරාගත් කාලයක් තුළ ජීවත් වෙමින්, සිදුවන දේ බැලීම, සවන් දීම, ප්‍රශ්න මඟින් විමසීම හා සාධක එකතුකිරීම තුළින් එම පුද්ගලයන් පිළිබඳව විග්‍රහයක් කිරීම ය.[7] "(Hamamersley & Akinson, 1983:02) මානව වංශ විධි විවරණ පර්යේෂණයක දැකිය හැකි ලක්‍ෂණ කිහිපයක් මෙයින් පැහැදිලි වේ. එනම්, පර්යේෂකයා අන්තර් පුද්ගල සම්බන්ධතා පැවැත්වීම, පර්යේෂණ භූමියෙහිම නිශ්චිත කාල පරාසයක් රැඳෙමින් පර්යේෂණ භූමියෙහි සිදුවන දේ හොඳින් නිරීක්ෂණය කරමින් විවිධ උපක්‍රමයන් ඔස්සේ තොරතුරු ගවේෂණයෙහි හා සංවිධානයෙහි නිරත වීම ආදියයි. එමගින් සාක්ෂි සහිතව එකී පුද්ගලයන් පිළිබඳ විග්‍රහයක් මානව වංශ විධි විවරණ පර්යේෂණයකින් සිදු වේ. එසේ ම මානව වංශ විධි විවරණ පර්යේෂණය සිද්ධි අධ්‍යයනයකට සමාන බවත්, එහිදී පර්යේෂකයා ක්ෂේත්‍රය තුළ ජීවත්වීම ද අවශ්‍ය බව බැරෝ හා මිල්බර්න් විග්‍රහ කරයි. ''මානව වංශ විවරණය යනු සංස්කෘතික කණ්ඩායමක් විස්තර කිරීමේ ක්‍රමය වේ. මෙය සිද්ධි අධ්‍යයනයකට සමාන ය. පුද්ගලයා හා සම්බන්ධ වෙමින්, සහභාගීත්ව නිරීක්‍ෂණය මගින් තෝරාගත් කාලයක් තුළ ක්ෂේත්‍රයේ ගත කරමින් තොරතුරු ලබා ගනී.''[8] (Barro & Milburn, 1986:94) මේ අනුව මානව වංශ විධි විවරණ පර්යේෂණ පිළිබඳ විවිධ අංශවලින් විවිධ නිර්වචනයන් ඉදිරිපත්ව ඇති බව පෙනේ. ඇතමෙකුට මෙම පර්යේෂණ දර්ශනාත්මක පර්යාලෝකයක් වන අතර ඇතමෙකුගේ

පිළිගැනීම එය හුදෙක් දත්ත රැස් කිරීමේ ක්‍රමයක් පමණක් බවයි. එසේ ම සහභාගීත්ව නිරීක්ෂණය, ගුණාත්මක පර්යේෂණ, ප්‍රත්‍යක්‍ෂ අධ්‍යයන යන පද සමග යෙදීම ද මෙම පර්යේෂණ හඳුනා ගැනීමේදී ඇති වන ගැටලුවකි.[9] (Hitchcook & Hughes, 1993. p.52) එසේ වුවත් ජැන්කෝවාස්කි හා වෙස්ටර් මානව විධි විවරණ සුවිශේෂ ලක්‍ෂණ සහිතව විග්‍රහ කර ඇත.

"එදිනෙදා චර්යාවන්හි සිට ආගම හා කලා ශිල්ප වැනි අති විශාල සමාජ සංස්ථා දක්වා වෙනස් වන විවිධාකාර සංස්කෘතික ස්වභාවයන් පිළිබඳව ආදිකාලීනව කෙරෙන නිරීක්‍ෂණ කෙරෙහි නැඹුරුවක් දක්වන බැවින් මානව විධි විවරණ පර්යේෂණ අනෙකුත් ගුණාත්මක පර්යේෂණ වලින් වෙනස් වේ"[10] (Jancovasky and Wester -1991)

මේ අනුව විමසා බැලීමේදී මානව වංශ විධි විවරණ සුවිශේෂී පර්යේෂණ ක්‍රමයක් වශයෙන් හඳුනා ගත හැකි ය. එහිදී පර්යේෂණ ක්‍ෂේත්‍රය, කාලය, පුද්ගලයන් හා පර්යේෂණය සඳහා ප්‍රස්තුත සියලු කරුණු පිළිබඳ සැලකිලිමත් විය යුතු බව හඳුනාගත හැකි ය. සමාජ විද්‍යා ක්‍ෂේත්‍රයේ පර්යේෂණ ක්‍රමවේදයක් ලෙස භාවිත මානව වංශ විවරණ අධ්‍යාපන ක්‍ෂේත්‍රයේ වර්තමානයේ ඉතා ජනප්‍රිය අධ්‍යයන ක්‍ෂේත්‍රයක් බවට පත්ව ඇත. සමාජ විද්‍යා ක්‍ෂේත්‍රයේ පර්යේෂණයෙහි යෙදෙන සමාජ විද්‍යාඥයන් විවිධ සාමාජීය ප්‍රස්තුතයන් අධ්‍යයනය කර ඇත. ආරම්භක අවධීන්හී අප්‍රිකාව, ලතින් ඇමරිකාව හා ඕෂනියාව ආදී විවිධ රටවල ගෝත්‍රික සමාජයන්හි ඔවුන්ගේ චර්යා රටා, සංස්කෘතීන්, විශ්වාස පද්ධතීන් හා අගයන් අධ්‍යයනය කිරීම සඳහා යොදා ගෙන ඇත. සැමෝවා හා මුණ්ඩුගුමාර් වැනි ගෝත්‍රික සමාජ පිළිබඳව මීඩ් (Mead) විසින් කරන ලද අධ්‍යයන මේ සඳහා උදාරණයකි. එසේ ම ලාංකේය සංදර්භය තුළ නන්දසේන රත්නපාල විසින් කරන ලද 'ශ්‍රී ලංකාවේ යාචකයෝ,' 'පොලිසිය හා ගණිකා වෘත්තිය' වැනි අධ්‍යයන මෙන්ම මොණරාගල දිස්ත්‍රික්කයේ අධ්‍යාපනය පිළිබඳ බේකර් විසින් කරන ලද 'වනගත කළුලෑල්ල' (Black Board in the Jungle) මෙකී මානව වංශ විවරණ ක්‍රමය අනුව කරන ලද



පර්යේෂණ වේ. මේ අනුව සමාජයක වෙසෙන සාමාජීය කණ්ඩායමක විවිධ ලක්‍ෂණ විවිධ පැතිකඩ ඔස්සේ එකී කණ්ඩායම සමඟ වෙසෙමින්, අන්තර් සබඳතා පවත්වමින් පුළුල් හා සවිස්තරාත්මකව අධ්‍යයනය කිරීමේ විධිමක් ක්‍රියාවලිය මානව වංශ විවරණ පර්යේෂණ වේ. අධ්‍යාපන ක්‍ෂේත්‍රයෙහි ද පාසල් සමාජය තුළ එහි සාමාජිකයන්ගේ ක්‍රියාකාරීත්වය අර්ථ නිරූපණය කිරීම සඳහා මෙකී පර්යේෂණ ක්‍රමය යොදා ගත හැක. ඒ සඳහා සහභාගීත්ව නිරීක්ෂණය තුළින් ශිෂ්‍ය භූමිකා, ගුරු භූමිකා, විදුහල්පති භූමිකාව, ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය, පාසල් ප්‍රජාව හා පාසල් සංස්කෘතිය ආදිය අධ්‍යයනය කළ හැක.

**මානව වංශ විවරණ පර්යේෂණවල ලක්‍ෂණ :**

මානව වංශ විවරණ ක්‍රමයෙහි ලක්‍ෂණ පර්යේෂකයන් විවිධ අයුරින් විග්‍රහයට ලක්කර ඇති අතර මානව වංශ විවරණ පර්යේෂණවල මූලික ලක්ෂණ 04 ක් ඇට්කින්සන් හා හැමර්ස්ලි (Atkinson & Hammersley -1994) විසින් දක්වයි. එනම්,

1. මානව වංශ විධි වියරණ පර්යේෂණ උද්ගාමී ස්වරූපයක් ගනී. එනම් පර්යේෂකයා රැස්කරගන්නා ප්‍රාථමික අත්දැකීම් ආශ්‍රිතව න්‍යාය සංවර්ධනය සඳහා යොමු වේ.
2. මානව විධි විවරණ පර්යේෂණ මඟින් රැස්කරගන්නා තොරතුරු විවිධ අර්ථකථනයන් සඳහා විවෘත වේ. එමගින් පිළිබිඹු කරන්නේ එම තොරතුරුවල ඇති විස්තරාත්මක ස්වරූපයයි.
3. ඉතා කුඩා පුද්ගල කණ්ඩායමක් පිළිබඳ ගැඹුරු අධ්‍යයනයක් සඳහා යොමුවේ.
4. එම කණ්ඩායමේ භාෂාව හා ක්‍රියාකාරීත්වය පිළිබඳව ඉතා පුළුල් අර්ථකථන වලින් සංයුක්ත වූ විශ්ලේෂණයක් ඇත.[11]

වශයෙනි. හිට්ච්කොක් හා හුග්ස්ට (Hitchcock & Hughes -1995) අනුව මානව වංශ විධි විවරණ පර්යේෂණවල අන්තර්ගත ලක්‍ෂණ 6කි. එනම්,

- කණ්ඩායමක් පිළිබඳ විස්තරාත්මක සංස්කෘතිකමය දැනුමක් නිෂ්පාදනය කිරීම
- එම කණ්ඩායමෙහි සාමාජිකයන්ගේ අදහස් වලින් එක්තරා සංස්කෘතික සංදර්භයකට අදාළ ක්‍රියාකාරීත්වයන් පිළිබඳ විග්‍රහ කිරීම
- කණ්ඩායමක හෝ සංස්කෘතියක සාමාජිකත්වයෙහි ලක්ෂණ පිළිබඳ තොරතුරු අනාවරණය කිරීම
- සමාජ අන්තර් ක්‍රියාවන්හි රටාවන් විස්තර කිරීම හා විශ්ලේෂණය කිරීම
- හැකිතාක් දුරට අභ්‍යන්තර ඇගයීමක් ලබාදීම
- න්‍යායන් ගොඩ නැගීම[12] ආදී වශයෙනි.

පර්යේෂකයාගේ සමාජ භූමිකාව (සහභාගී නිරීක්ෂකයෙකු ලෙස හා කණ්ඩායමෙහි සාමාන්‍ය සාමාජිකයෙකු ලෙස), අභ්‍යන්තර බාහිර දැක්ම හා පර්යේෂකයාගේ පුද්ගල බද්ධ බව, වලංගුතාව හා විස්වාසීතාව[13] ආදී වශයෙන් මානව වංශ විධි පර්යේෂණ ක්‍රමයේ විද්‍යාත්මක පැතිකඩක ද අවධාරණය කරමින් එහි ලක්ෂණ පිළිබඳ කරන පැහැදිලි කිරීමක් ද දැකිය හැකි ය. අසෝකා ජයසේන හා සුසිලා ඇම්බැක්ක මූලික පොදු ලක්ෂණ 03ක් ඔස්සේ මෙය සාකච්ඡා කරයි. එනම්,

1. අර්ථය
2. ස්වාභාවික සන්දර්භය
3. පර්යේෂකයාගේ භූමිකාව වශයෙනි.[14]

## 1. අර්ථය (Meaning)

අර්ථය යන්නෙන් තොරතුරු අර්ථකථනය කිරීම අර්ථවත් කරයි. පර්යේෂකයා සතු තොරතුරු නොයෙක් ආකාරයට අර්ථකථනය කිරීමේ කුසලතාවක් පර්යේෂකයාට පැවතිය යුතු ය. පුද්ගලයා විවිධ සාධක පදනම් කර ගෙන සිය අනන්‍යතාව ගොඩ නගා ගනිමින් අන්‍යයන් සමග අන්තර් ක්‍රියාවලියකට යොමු වන්නේ යම්සේ ද එසේ ම පර්යේෂකයාට විචල්‍ය අතර

16 OCT 2017



අන්තර් ක්‍රියාකරණය වැදගත් වේ. පර්යේෂකයා සිය පර්යේෂණයේදී ඕනෑම ක්‍රියාවකට දෙන අර්ථකථනය වැදගත් බව මේ අනුව පැහැදිලි වේ.

ඇට්කින්සන් හා හැමස්ලිගේ (Atkinson & Hammersley) අදහස් අනුව මානව වංශ විධි වියරණ පර්යේෂණවල මූලික ලක්ෂණ අතර, ''මානව වංශ වියරණ විධි පර්යේෂණ මඟින් රැස්කරගන්නා දැනුම විවිධ අර්ථකථනයන් සඳහා විවෘත වේ''[15] යනුවෙන් විග්‍රහ කර ඇත්තේ ද මෙකී සාධකයයි. සහභාගීත්ව නිරීක්ෂණ, ලේඛන තොරතුරු, සම්මුඛ සාකච්ඡා හා භාෂීය අභාෂීය සංනිවේදන නිරීක්ෂණය ආදී ක්‍රම මගින් පර්යේෂකයා ලබාගත් දැනුම පිළිබඳ පර්යේෂකයාට අර්ථ දැක්විය හැක. මේ අනුව අර්ථය යන සාධකය මානව වංශ විධි වියරණ පර්යේෂණවල වැදගත් ලක්ෂණයක් වශයෙන් හැඳින්විය හැක.

## 2. ස්වාභාවික සන්දර්භය

සෑම අර්ථවත් සංසිද්ධියක්ම ස්වාභාවික සන්දර්භය තුළ අධ්‍යයනය කිරීම මානව වංශ විවරණ විධි පර්යේෂණයේ තවත් සුවිශේෂී ලක්ෂණයකි. පර්යේෂණය දියත් කිරීමේදී පර්යේෂකයා එකී සන්දර්භය තුළ ජීවත්විය යුතු ය. මෙකී ලක්ෂණය විග්‍රහ කරන මැලිනොව්ස්කි (Malinoviski) සෑම පර්යේෂකයෙකුම තමා අධ්‍යයනයට පාත්‍ර කරන සිද්ධිය/ පුද්ගලයා/ ප්‍රපඤ්චය ආශ්‍රිත යථාර්ථය අවබෝධ කර ගැනීමට නම් එම අධ්‍යයනයට පාත්‍රවන දෙයට අදාළ සංස්කෘතිය තුළම එම දේ අධ්‍යයනයට පාත්‍ර කළ යුතු යැයි දක්වා තිබේ.[16]

මේ අනුව පර්යේෂකයා පර්යේෂණ භූමිය තුළ රැඳී සිටිමින් එකී සංස්කෘතිය අභ්‍යන්තරයේ ම සිටිමින් සංසිද්ධිය අධ්‍යයනය කළ යුතු ය. උදාහරණ වශයෙන් වික්ටෝරියා බේකර්ගේ Black Board in the jungle 'වනගත කළුලෑල්ල' හා නන්දසේන රත්නපාලගේ ශ්‍රී ලංකාවේ යාචකයෝ පර්යේෂණ සිදු කර ඇත්තේ පර්යේෂණ භූමියෙහි රැඳී සිටීමෙන් ය. එසේම මාග්‍රට් මීඩ් (Mead) විසින් සැමෝවා හා මුණ්ඩුගුමාර් ගෝත්‍රික සමාජ

16 OCT 2017



පිළිබඳව සිදුකරන ලද පර්යේෂණ ද මෙම වර්ගයේ සුවිශේෂී පර්යේෂණයන් වේ. එය සිදු කරනු ලැබුයේ ද ස්වාභාවික සන්දර්භය තුළ ය. එමගින් පර්යේෂකයාට ස්වාභාවික සංදර්භය තුළ යථාර්ථය විවිධ සාධක සහිතව පසක් කරගත හැක. පර්යේෂණය ස්වාභාවික පරිසරයේ දියත් කරන බැවින් පර්යේෂකයාට ඇවැසි පරිදි පර්යේෂණය හැසිරවීමට අවස්ථාව නොමැතිවීම ද මෙහිදී වැදගත් ය. සිය පර්යේෂණ ප්‍රශ්න හා අරමුණු පර්යේෂණය දියත් කරන පරිසරයට උචිත ලෙස සකස්කළ යුතු ය. ස්වාභාවික සන්දර්භය තුළ සිදුවන හෙයින් කලින් තීරණය කළ පර්යේෂණ සැලැස්ම වෙනස්කිරීමට ද අලුතින් සැකසීමට ද පර්යේෂකයාට මේ අනුව ඇතැම් විට සිදු විය හැක. එය මානව වංශ විධි විවරණ පර්යේෂණවල දැකිය හැකි ලක්ෂණයකි.

## 3. පර්යේෂකයාගේ භූමිකාව

සෑම ක්‍රියාවකටම අර්ථකථන සපයන්නා පර්යේෂකයා වන බැවින් පර්යේෂකයාට සුවිශේෂී ස්ථානයක් ගුණාත්මක පර්යේෂණ පිරි සැලසුම් වලදී හිමිවේ. මේ අනුව මානව වංශ විධි විවරණ පර්යේෂණ ක්‍රමය අනුගමනය කරන පර්යේෂකයා අර්ථ නිරූපණය කරන වේදයකු ලෙස (Interective Sunject) අශෝකා ජයසේන හා අම්බැක්ක (2015) පවසයි.[17]

සමස්ත පර්යේෂණ ක්‍රියාවලියෙහිම ප්‍රාථමික උපකරණය පර්යේෂකයා වන බැවින් මෙකී කරුණ ඉතා වැදගත් වේ. මෙම ක්‍රියාවලියේදී පර්යේෂකයා පිළිගත් භූමිකාවක් නිරූපණය කරමින් පර්යේෂණ භූමියට ඇතුල් විය යුතු ය. පර්යේෂකයාගේ සමාජ භූමිකාවේදී සහභාගීත්ව නිරීක්ෂකයෙකු ලෙස පර්යේෂණ ක්‍රියාවලිය සිදුවන ජන සමාජයට ප්‍රවේශවීමේදී පර්යේෂකයා එකී ජනසමාජයේ අන්තර් පුද්ගල සම්බන්ධතා, පුද්ගල චර්යා රටා, ආකල්ප හා අගයන්, චින්තනයන් පිළිබඳව නිරීක්ෂණය කළ යුතු ය. පාතාල ලෝකය, මත් ද්‍රව්‍ය වෙළදාම හා වෙනත් සාමාජීය සාපරාධී ක්‍රියා සහිත අංශ යොදා ගනී නම් එහිදී පර්යේෂණ භූමියේ පර්යේෂකයාට මුහුණදීමට සිදුවන ගැහැට හා තර්ජන ද



සැළකිලිත් විය යුතු ය. පර්යේෂණ ජන කණ්ඩායමේ ම සාමාජිකයෙකු වශයෙන් සමාජගත වීම මෙහිදී විශේෂයෙන් වැදගත් වේ. වික්ටෝරියා බේකර්ස් සිය පර්යේෂණයේදී 'ගුරුවරයෙකු' ලෙස ජන සමාජයේ සාමාජිකයෙකු වූ අතර නන්දසේන රත්නපාල 'යාචක' වෙස් ගෙන නිත්‍ය සාමාජිකයෙක්ව යාචක සමාජයේ කටයුතු කර ඇත. පර්යේෂකයාගේ අභ්‍යන්තර හා බාහිර දෘෂ්ටිය, පර්යේෂකයාගේ භූමිකාවේදී වැදගත් සාධකයකි. පර්යේෂණයට පාත්‍ර කරගනු ලබන ජන සමාජය පිළිබඳව තාත්වික හා යථාර්ථවාදී අව්‍යාජ අත්දැකීම් ලබාගැනීම, පර්යේෂණයේ සාර්ථකත්වයට ඉවහල් වේ. අභ්‍යන්තර දෘෂ්ටියෙන් ජන සමාජය දෙස බැලීමට නම් පර්යේෂකයා සාමාන්‍ය සාමාජිකයෙකු වශයෙන් ජන සමාජයට සම්බන්ධ විය යුතු ය. එවිට යම් යම් සිද්ධීන් සම්බන්ධයෙන් ඔවුන් ලබාදෙන අර්ථකථන ඔවුන්ගේම දෘෂ්ටියෙන් දැකීමේ හැකියාව ලබයි. මේ අනුව පර්යේෂකයාගේ භූමිකාව මෙහිදී වැදගත් ලක්ෂණයක් බව හඳුනාගත හැකි ය.

විවිධ ලක්ෂණ වලින් සමන්විත මානව වංශ විවරණ පර්යේෂණ දත්ත ත්‍රිකෝණීකරණය කරමින් කතාන්තර ක්‍රමයෙන් ඉදිරිපත් කිරීම එහි ලක්ෂණයකි. එබැවින් එය වර්ණනාත්මක කතා මාලාවක් යැයි ද හැඳින් වේ. පර්යේෂණ භූමියෙහි සාමාජිකයන් සමග ඔවුන්ගේ සාමාජිකයෙක්ව ජීවත් වෙමින් සෙවනැල්ලක්ව සියුම් සහභාගීත්ව නිරීක්ෂණය මූලික කරගත් පර්යේෂණ ක්‍රමවේදයක් ලෙස මානව වංශ විවරණ ක්‍රමය හඳුනාගත හැකි අතර එය අධ්‍යාපන පර්යේෂණ සඳහා භාවිත කළ හැකි යෝග්‍ය වූ පර්යේෂණ ක්‍රමවේදයකි.

### මානව වංශ විවරණ පර්යේෂණයක පියවර :

මානව වංශ විවරණ විධි විවරණ පර්යේෂණ අනෙක් පර්යේෂණවලට වඩා විවෘත හා නම්‍යශීලී බවකින් දියත් කළ හැකි බව එහි අර්ථ ක්‍රියාකාරීත්වය තුළින් පිළිබිඹු වේ. පූර්ව කල්පිත හෝ පර්යේෂණ ප්‍රශ්න නොමැතිව වුව ද පර්යේෂණය දියත් කළ හැකි වුව ද එහි වඩා සාර්ථකත්වය උදෙසා පූර්ව

සැලැස්මක් තිබීම වැදගත් වේ. එකී සැලැස්ම හෝ පූර්ව නිශ්චිත අරමුණු වෙනස් කරමින් මෙය දියත් කළ හැකි වීම මෙහි සුවිශේෂ ලක්‍ෂණයයි. කෙසේ වුව ද මානව වංශ විවරණ පර්යේෂණයක ද නිශ්චිත පියවර ඔස්සේ ගමන් කිරීම තුළින් පර්යේෂණ සාර්ථකත්වයට ළගාවීම පහසු වේ. ඒ අනුව මානව වංශ විවරණ පර්යේෂණවලදී අනුගමනය කළ හැකි පියවර 7ක් හිච්කොක් හා හුග්ස් හඳුන්වා දී ඇත. එනම්,

1. ක්‍ෂේත්‍රයක් හඳුනා ගැනීම
2. භූමිකාවන් හඳුනා ගැනීම හා සුළුවෙන් ක්‍ෂේත්‍රයට ඇතුළු වීම
3. පරික්‍ෂිතයන් හඳුනා ගැනීම
4. ක්‍ෂේත්‍ර සම්බන්ධතා ගොඩ නැගීම
5. ක්‍ෂේත්‍රය තුළ දත්ත රැස් කිරීම
6. ක්‍ෂේත්‍රයෙන් පිටත දත්ත රැස් කිරීම
7. විශ්ලේෂණය (Hitchcock & Hughes -1995)[18] වශයෙනි.

මෙහිදී මෙම පියවරයන්ට පෙර මූලික තත්වයන් සම්පාදනය කිරීම ද මෙහි දී වැදගත් බව දක්වයි. එහෙත් මෙකී පියවර පර්යේෂකයෙකු දැඩිව අනුගමනය කළ යුතු පියවර නොවන බව ද එකී පියවර ගැටලුකාරී බව ද දයාලතා ලේකම්ගේ (2006) විග්‍රහ කරයි.[19] ගුණාත්මක පර්යේෂණයක පියවර වශයෙන් අශෝකා ජයසේන හා ඇම්බැක්ක දක්වනුයේ,

- ක්‍ෂේත්‍ර සැකසුම
- නියැදිකරණය
- ශිල්පීය ක්‍රම හෝ ක්‍ෂේත්‍රය සමග අන්තර්ක්‍රියාකරණය උදෙසා අනුගමනය කළ යුතු ක්‍රම පිළිබඳ තීරණය කිරීම ආදියයි.[20]

සිංග්ලේටර් (Singleton etal, 1988:306) ඇතුළු පිරිසගේ අදහස අනුව මානව වංශ විධි විවරණ පර්යේෂණයක,

- පර්යේෂණ ක්‍ෂේත්‍රය තෝරා ගැනීම



- පර්යේෂණ ක්‍ෂේත්‍රයට ඇතුළු වීම
- ක්‍ෂේත්‍රයේ ම පුද්ගලයෙකු බවට පත්වීම
- තොරතුරු හා දත්ත රැස් කිරීම
- තොරතුරු විශ්ලේෂණය හා න්‍යායික පසුබිම සංවර්ධනය කිරීම යන පියවර වලින් සමන්විත බව දක්වයි.[21]

## 1. ක්‍ෂේත්‍ර සැකසුම (Formatting the field) හෙවත් පර්යේෂණ ක්‍ෂේත්‍රය හඳුනා ගැනීම

පර්යේෂකයාගේ පර්යේෂණ ගැටලුව අධ්‍යයනය කිරීම සඳහා මානව වංශ විධි විවරණ පර්යේෂණය දියත් කිරීමට උචිත ක්‍ෂේත්‍රයක් තෝරා ගැනීම හා එහි නිශ්චිත සීමා තීරණය කර ගැනීම මෙහිදී සිදුවේ. තෝරාගත් ක්‍ෂේත්‍රය තුළ ඇති තොරතුරු මෙන් ම ක්‍ෂේත්‍රයෙන් පිට තොරතුරු හඳුනා ගැනීම වැදගත් වේ. ක්‍ෂේත්‍රයේ ප්‍රමාණය, ඇතුළත් වන පුද්ගලයන් සංඛ්‍යාව, තෝරා ගන්නා ප්‍රධාන භූමිකා, තේමා හා දත්ත රැස් කිරීමේ මූලාශ්‍රයන් පිළිබඳ අවබෝධයක් ද මෙහිදී තිබිය යුතු අතර පර්යේෂණයේදී ඇති විය හැකි ගැටලු හඳුනා ගැනීම ද මෙහි දී වැදගත් වේ. හාමස්ලේ හා ඇට්කින්සන් මානව වංශ විධි විවරණ පර්යේෂණයක දී පර්යේෂණ ක්‍ෂේත්‍රය තෝරාගැනීමේදී සැළකිය යුතු කරුණු 05ක් දක්වයි.

1. හුරු පුරුදු නොවන ආගන්තුක ක්‍ෂේත්‍රයක් වීම. (එහිදී පූර්ව විනිශ්චයන් නොමැති නිසා පුද්ගල අගතිය බල නොපාන්නේ වෙයි.)
2. පහසුවෙන් ළගාවිය හැකි, සරල තැනක් වීම හා අවුල් සහගත ස්ථානයක් නොවීම.
3. අවසර ලබාගත හැකි වීම හා නිරීක්ෂණයට පහසුකම් ලබාදීම.
4. බාධා රහිත තැනක් වීම හා පර්යේෂකයාගේ අභිමතය පරිදි නිරීක්ෂණය කිරීමට පාලක හා අනෙක් අංශ වලින් බාධා නොවිය යුතු ය.

5. සහභාගීත්වය සහිත තැනක් වීම හා තමන්ට අවශ්‍ය පරිදි අන් අයගේ සහයෝගය ලබාගතහැකි වීම.[22]

මේ අනුව මානව වංශ විධි විවරණ පර්යේෂණයකදී පර්යේෂණ ක්ෂේත්‍ර සැකසුම තෝරා ගැනීම පළමු පියවර වශයෙන් හඳුන්වා දිය හැක.

## 02. උපායමාර්ග (Stratergy) හෙවත් පර්යේෂණ ක්ෂේත්‍රයට ඇතුළු වීම

පර්යේෂණ භූමියකට හෙවත් ක්ෂේත්‍රයකට ඇතුල්වීම මානව වංශ විධි විවරණයක ප්‍රධාන පියවරකි. පර්යේෂණ භූමියට යාමට පෙර අදාළ වගකීම් දරන්නාගෙන් අවශ්‍ය අවසරය ලබාගත යුතු ය. අධ්‍යාපනයට අදාළ පර්යේෂණයක් නම් පළාත් හෝ කලාප අධ්‍යක්ෂකවරුන්ගෙන් නිසි අවසරය ගත යුතු ය. මත්ද්‍රව්‍ය ආදී සමාජ සාපරාධී කරුණු පිළිබඳ කෙරෙන පර්යේෂණයක් නම් ඒ පිළිබඳ ආරක්ෂක අංශ දැනුවත් කිරීම හා අවසර ගැනීම පර්යේෂකයාගේ ආරක්ෂාවට වඩාත් වැදගත් ය. තොරතුරු ලබාගැනීම උදෙසා සම්මුඛ සාකච්ඡා, නිරීක්ෂණ, ප්‍රශ්නාවලි ලබාදීමට පෙර ද යම්කිසි ක්‍රමානුකූල පිළිවෙලක් සකස්කර ගැනීම සඳහා මෙන්ම නිශ්චිත කාල පරාසයක් තුළ පර්යේෂණය අවසන් කිරීමට පර්යේෂකයාට උපායමාර්ග භාවිත කිරීමට සිදු වේ. එකී තොරතුරු දත්ත ත්‍රිකෝණිකරණය තුළින් තහවුරු කරගත යුතු ය. එසේම පර්යේෂණභූමියේ පොදු විනය මාලාවන් ආරක්ෂා කරමින් පොදු නීතිවලට අවනතවීම ද පර්යේෂකයාගේ වගකීමයි. ක්ෂේත්‍රයට ඇතුළුවීම පිළිබඳව වොල්කර්ගේ (Walker,1980:p.49) ප්‍රකාශය මෙහි දී වැදගත් වේ.

"හැම පර්යේෂකයෙකුම ඉතා ආරක්ෂිත ලෙස ක්ෂේත්‍රයට ඇතුළු වීමට මෙන්ම ඒ සඳහා අවසර ලබාගැනීමට අවශ්‍ය පූර්ව විධිවිධාන යෙදිය යුතු අතරම ක්ෂේත්‍රයට ඇතුළත්වීමට පැහැදිලි හේතුවක් හා සුදුසු භූමිකාවක් පිළිබඳ සැලසුම් ද සකස් කරගත යුතු ය.[23]



මේ සඳහා ඉතාමත් මෘදු එළඹුමක් වඩාත් සුදුසු බවත්, එසේ ම ක්ෂේත්‍රයට ඇතුළුවීම හා එහි සිය භූමිකාව ගොඩනගා ගැනීම ප්‍රධානියාගේ ආධාරයෙන් කළ හැකි බව හිච්කුක් හා හුග්ස්ගේ[24] අදහසයි.

## 03. විධික්‍රම (Tactics) හෙවත් ක්ෂේත්‍රයේ ම පුද්ගලයෙකු බවට පත්වීම

පර්යේෂණයේම පුද්ගලයෙකු වීම හා පරීක්ෂිතයන් හඳුනා ගැනීම මානව වංශ විධි විවරණ පර්යේෂකයාගේ එක් පියවරකි. තමන්ට අවශ්‍ය තොරතුරු වඩා නිවැරදිව හා විශ්වසනීයත්ව යෙන් යුතුව ලබාගැනීමට පර්යේෂණයට ලක්වන්නන් හා පර්යේෂකයා අතර මනා සමාජ අන්තර්ක්‍රියාකාරීත්වයක් ගොඩනගා ගත යුතු ය. ඒ සඳහා පර්යේෂකයා විසින් යොදාගනු ලබන උත්සාහ හා ආකාරයන් විධි ක්‍රම ලෙස දැක්විය හැක. මානව වංශ විධි විවරණ පර්යේෂණයකදී තම පර්යේෂණය සඳහා තොරතුරු ලබාගන්නා පුද්ගලයන් හඳුනා ගැනීම අත්‍යවශ්‍ය ය. මූලිකවම පර්යේෂණය සඳහා සියලු දෙනාම තෝරාගත්ත ද පර්යේෂණයේ අවසන් අදියරේදී ඉන් කිහිප දෙනෙකුට පමණක් සීමාවිය හැක. තොරතුරු ලබාගැනීමේදී පාසල් පරිශ්‍රයේ සිසුන් පමණක් පරීක්ෂිතයන් ලෙස යොදාගැනීම අසාර්ථකය. ගුරුවරු, විදුහල්පති, දෙමාපියන් ආදී බහුවිධ කණ්ඩායම් ආශ්‍රයෙන් තොරතුරු ලබාගත යුතු ය. එමෙන්ම පරීක්ෂකයා ලබාගන්නා තොරතුරුවල සත්‍යතාව තහවුරු වීමට නම් එකී තොරතුරු ලබාදෙන පරීක්ෂිතයන් හා පර්යේෂකයා අතර විශ්වාසදායී හා සමීප අන්තර් පුද්ගල සම්බන්ධතා ගොඩනගා ගතයුතු ය. මෙහිදී තමාට තොරතුරු ලබාදෙන පුද්ගලයන් සමග සම්බන්ධතා පැවැත්වීමේදී තමාට මනා ශක්තියක් හා මගපෙන්වීමක් ලබාදෙන පුද්ගලයන් පිළිබඳව මනා අවබෝධයෙන් සිටිය යුතු ය.

## 04. ශිල්පීය ක්‍රම (Techniques) හෙවත් තොරතුරු හා දත්ත රැස් කිරීම

විවිධ ශිල්පීය ක්‍රම ඔස්සේ පර්යේෂකයෝ විවිධ දත්ත රැස්කර ගනිති. මානව වංශ විධි විවරණ පර්යේෂණ ක්‍රමවේදයේදී බොහෝවිට වාචික හා අවාචික සන්නිවේදන ආශ්‍රයෙන් දත්ත රැස්කිරීම සිදුකරනු ලබයි. මෙහිදී සම්මුඛ සාකච්ඡා, ප්‍රශ්නාවලි, සම්මුඛ පරීක්ෂණ, නිරීක්ෂණ, ශ්‍රව්‍ය දෘශ්‍ය පටි, ලිපි ලේඛන මගින් දත්ත රැස්කරගනු ලබයි. වාචික දත්ත රැස්කිරීමේදී පරීක්ෂිතයන්ගේ භාෂා ව්‍යවහාරයන් පිළිබඳව ප්‍රමාණවත් දැනුමක් පර්යේෂකයාට පැවතිය යුතු ය. එමෙන් ම අවාචික සන්නිවේදනය පිළිබඳව ද ප්‍රමාණවත් අවබෝධයක් පැවතිය යුතු ය. භාෂා ව්‍යවහාරයේ පවතින සියුම් ව්‍යවහාර පිළිබඳව මනා අවබෝධයක් පැවතීම පර්යේෂකයාට අවශ්‍ය තොරතුරු ලබාගැනීමට මනා පිටබලයක් වේ. ට්‍රෆ්ට (Traft) අනුව "කණ්ඩායමට අමුත්තෙකු, මිත්‍රයෙකු ලෙසින් ඇතුළු වී එම කණ්ඩායමේ පුද්ගලයන් අතර සන්නිවේදනය සඳහා භාවිත කරන නිශ්ශබ්ද භාෂාව හෙවත් සංඥා භාෂාව පිළිබඳව දැනගත යුතු ය.[25]

මානව වංශ විධි වියරණ පර්යේෂණවලදී ලිපි හා ලේඛනගත තොරතුරු මගින් ද දත්ත ලබා ගත හැක. සම්මුඛ සාකච්ඡා, ලේඛන හා ප්‍රශ්නාවලි මගින් ද යම් තොරතුරු ලබාගත හැකි ය. එහෙත් මානව වංශ විධි විවරණයේ ප්‍රධාන දත්ත ලබා ගැනීමේ මෙවලම වනුයේ සහභාගීත්ව නිරීක්ෂණයයි. මේ අනුව තොරතුරු හා දත්ත රැස්කිරීම මානව වංශ විධි විවරණ පර්යේෂණවල වැදගත්ම පියවරකි.

## 05. දත්ත විශ්ලේෂණය

පර්යේෂණයේ සාරය හෙවත් අග්‍රගණ්‍ය කොටස මෙම කොටසයි. මෙහිදී ලබාගත් දත්ත පරීක්ෂා කිරීම, දත්ත ගැටලුවට අවශ්‍ය පරිදි විශ්ලේෂණය කරමින් වාර්තාව පිළියෙල කර නිගමන යෝජනා ඉදිරිපත් කරමින් පර්යේෂණය නිමා කරයි.



දත්ත විශ්ලේෂණයේදී පර්යේෂකයා විවිධ උපාය මාර්ග ඔස්සේ ලබාගත් දත්ත එකිනෙක සංසන්දනය කරමින් තොරතුරු ඉදිරිපත් කරයි. එය දත්ත ත්‍රිකෝණීකරණය නම් .මානව වංශ විවරණ දත්ත විශ්ලේෂණය පරිගණක මගින් කළ නොහැක්කේ එය කතාවක්මෙන් ගොනු කරන හෙයිනි. ඒ අනුව පර්යේෂණයක දත්ත විශ්ලේෂණය වැදගත් පියවරකි. එතුළින් පර්යේෂකයාගේ සොයා ගැනීම් හා යෝජනා නිගමන ඉදිරිපත් කරයි.

මේ අනුව විමසා බැලීමේදී ගුණාත්මක පර්යේෂණ අතර මානව වංශ විවරණ පර්යේෂණ ක්‍රමය සුවිශේෂී සාමාජීය ගැටලු නිරාකරණය කර ගැනීම සඳහා යොදා ගත හැකි ක්‍රමයක් වශයෙන් හැඳින්විය හැකි ය. සමාජ විද්‍යා පර්යේෂණ ක්ෂේත්‍රයේ ප්‍රකට පර්යේෂණ ක්‍රමයක් වන මානව වංශ විවරණ පර්යේෂණ වර්තමානයේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ ගැටලු විසඳා ගැනීම සඳහා ද යොදාගත හැකි පර්යේෂණ ක්‍රමයක් වශයෙන් ද හඳුනා ගත හැක.

## ආන්තික සටහන්

1. අශෝකා ජයසේන සහ සුසිලා කුමාරි අම්බැක්ක, පර්යේෂණ ක්‍රම විද්‍යා ප්‍රවේශය, මරදාන: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ,2015, පි. 20,21
2. එම, පි. 44.
3. එම, පි. 44.
4. Robertson,I, Sociology. New york, Worth Publications, 1981:13
5. සිල්වි සේනාධීර සහ ශාමින්ද වනසිංහ, පර්යේෂණ ක්‍රමවේදය, මරදාන: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ, 2016., පි. 134.
6. එම, පි. 137.
7. Hammersley, M., and Atkinson, Ethnography, Principles in Practice. London, Tavistock Publications, 1983 :02
8. සිල්වි සේනාධීර සහ ශාමින්ද වනසිංහ, පර්යේෂණ ක්‍රමවේදය, මරදාන: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ, 2016, පි. 136.
9. දයාලතා ලේකම්ගේ, අධ්‍යාපනය සඳහා ගුණාත්මක පර්යේෂණ, කර්තෘ ප්‍රකාශන,2006, පි. 49.
10. -එම.

11. දයාලතා ලේකම්ගේ, අධ්‍යාපනය සඳහා ගුණාත්මක පර්යේෂණ, කර්තෘ ප්‍රකාශන, 2006, පි. 49.
12. -එම. පි. 50.
13. Hitchcock, G, and Hughes, D, Research and the techer, London, Routledge, 1995.
14. අශෝකා ජයසේන සහ සුසිලා කුමාරි අම්බැක්ක, පර්යේෂණ ක්‍රම විද්‍යා ප්‍රවේශය, මරදාන: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ, 2015, පි. 44, 45.
15. දයාලතා ලේකම්ගේ, අධ්‍යාපනය සඳහා ගුණාත්මක පර්යේෂණ, කර්තෘ ප්‍රකාශන, 2006, පි. 49.
16. අශෝකා ජයසේන සහ සුසිලා කුමාරි අම්බැක්ක, පර්යේෂණ ක්‍රම විද්‍යා ප්‍රවේශය, මරදාන: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ, 2015, පි. 45.
17. -එම පි. 46.
18. Hitchcock, G. & Hughes, D. (1995), Research and the Teacher, A qualitative introduction to School based research, Routledge, p. 56.
19. දයාලතා ලේකම්ගේ, අධ්‍යාපනය සඳහා ගුණාත්මක පර්යේෂණ, කර්තෘ ප්‍රකාශන, 2006, පි. 54.
20. අශෝකා ජයසේන සහ සුසිලා කුමාරි අම්බැක්ක, පර්යේෂණ ක්‍රම විද්‍යා ප්‍රවේශය, මරදාන: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ, 2015, පි. 49-55.
21. සිල්වි සේනාධීර සහ ශාමින්ද්‍ර වනසිංහ, පර්යේෂණ ක්‍රමවේදය, මරදාන: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ, 2016, පි. 146.
22. සිල්වි සේනාධීර සහ ශාමින්ද්‍ර වනසිංහ, පර්යේෂණ ක්‍රමවේදය, මරදාන: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ, 2016, පි. 141.
23. දයාලතා ලේකම්ගේ, අධ්‍යාපනය සඳහා ගුණාත්මක පර්යේෂණ, කර්තෘ ප්‍රකාශන, 2006, පි. 55.
24. Hitchcock, G. & Hughes,D. (1993), Research and TeacherßA qïlititative introduction to School based research, Routledge, p. 56.
25. සිල්වි සේනාධීර සහ ශාමින්ද්‍ර වනසිංහ, පර්යේෂණ ක්‍රමවේදය, මරදාන: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ, 2016, පි. 15.



## ආශ්‍රිත ග්‍රන්ථ


1. උයන්ගොඩ, ජයදේව, සමාජීය-මානවීය විද්‍යා පර්යේෂණ, සමාජ විද්‍යාඥයින්ගේ සංගම් ප්‍රකාශන, කොළඹ 05, 2014.
2. උයන්ගොඩ, ජයදේව, සමාජීය විද්‍යා පර්යේෂණ යෝජනාවලියක් ලිවීම, සමාජ විද්‍යාඥයින්ගේ සංගම් ප්‍රකාශන, කොළඹ 05, 2016.
3. කොඩිතුවක්කු, ගොඩ්වින්, අධ්‍යාපන ක්ෂේත්‍රයේ සම්පරීක්ෂණ පර්යේෂණ, කතෘ ප්‍රකාශන, 2014.
4. ජයසූරිය, චන්ද්‍රා, අධ්‍යාපන පර්යේෂණ ක්‍රම ශිල්ප, ශ්‍රීදේවි මුද්‍රණ, 2007.
5. ජයසේන, අශෝකා සහ සුසිලා කුමාරි අම්බැක්ක, පර්යේෂණ ක්‍රම විද්‍යා ප්‍රවේශය, ඇස්, ගොඩගේ සහ සහෝදරයෝ. මරදාන, 2015.
6. ලේකම්ගේ, දයාලතා, අධ්‍යාපනය සඳහා ගුණාත්මක පර්යේෂණ, කර්තෘ ප්‍රකාශන, 2006.
7. සේනාධීර, සිල්වි සහ ශාමින්ද්‍ර වනසිංහ, පර්යේෂණ ක්‍රමවේදය, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ. මරදාන, 2016.
8. Robertson, I, Sociology. New york, Worth Publications, 1981.
9. Hammersley, M., and Atkinson, Ethnography, Principles in Practice.London, Tavistock Publications, 1983.
10. Hitchcock, G, and Hughes, D, Research and the teacher, London, Routledge, 1995.